# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,690 - 2011 ජනවාරි මස 21 වැනි සිකුරාදා - 2011.01.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 69 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 ජනවාරි මස 28 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 ජනවාරි මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දුරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# තනතුරු - ඇබෑර්තු

### යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

### කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ නඩත්තු ඉංජිනේරු තනතුර සඳහා බඳවා ගැනීම

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ නඩත්තු ඉංජිනේරු තනතුර සඳහා බඳවා ගැනීමට අයැදුම්පත් කැඳවනු ලැබේ.

පහත දක්වා ඇති ආකෘති පත්‍රය අනුව අංක 01 සිට 07 දක්වා පළමු පිටුවට ද, ඉතිරිය දෙවන පිටුවට ද වශයෙන් පිළියෙල කරන ලද අයැදුම්පත් 2011 පෙබරවාරි මස 11 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ''අධ්‍යක්‍ෂ ජනරාල්, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව, තැ. පෙ. 557, කොළඹ 10'' යන ලිපිනයට එවිය යුතුය. අයැදුම්පත් බහා එවන කවරයේ වමත්පස උඩ කෙළවරෙහි ''නඩත්තු ඉංජිනේරු තනතුර'' යනුවෙන් සඳහන් කළ යුතුය. ගැසට් නිවේදනයේ සඳහන් මූලික සුදුසුකම් ලැබූ අය පමණක් සම්මුඛ පරීක්‍ෂණයකට කැඳවනු ලැබේ.

02. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(අ) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගන්නා අපේක්ෂකයින් වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු අතර තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

(ආ) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

කාර්යක්‍ෂමතා කඩඉම

(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/2001 ට අනුව 04 වන වැටුප් පියවරට එළැඹීමට පෙර පළමුවන කාර්යක්‍ෂමතා කඩඉම ද, 07 වන වැටුප් පියවරට එළැඹීමට පෙර දෙවන කාර්යක්‍ෂමතා කඩඉම ද සමත් විය යුතුය. නියමිත කාලය ඇතුළත දී කාර්යක්‍ෂමතා කඩඉම සමත්වීමට අපොහොසත් වීම වැටුප් වර්ධක විලම්භනය කිරීමට හේතුවන අතර, දී ඇති කාලසීමාව ඉක්මවා ගන්නා කාලය වැටුප් වර්ධක විලම්භනය කෙරෙන කාලසීමාව වශයෙන් සැලකෙනු ඇත.

(ඈ) මෙම තනතුර සඳහා බඳවා ගනු ලබන නිලධාරීන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව සේවයට බැඳී වසර 05ක් ඇතුළත දෙවන භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. එසේ එම කාලය තුළ නියමිත භාෂා ප්‍රවීණතාව ලබා ගැනීමට අපොහොසත් වන නිලධාරීන්ගේ වැටුප් වර්ධක විලම්භනය කරනු ලැබේ. මෙම නිලධාරීන් සඳහා භාෂා ප්‍රවීණතාවන් ලෙස අ. පො. ස. (සා. පෙළ.) විභාගයෙන් සිංහල/දෙමළ ප්‍රධාන විෂයන් ලෙස සමත්වීම (දෙවන භාෂාව හෝ වෛකල්පික විෂයයන් වශයෙන් නොවේ) හා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වන කථන විභාගයකින් සමත්වීම හෝ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව පවත්වන විශේෂිත කුසලතා විභාගයෙන් සමත්වීම අවශ්‍ය වේ.

03. *වැටුප් හා දීමනා*

මෙම තනතුරට අදාළ මාසික ඒකාබද්ධ වැටුප් ක්‍රමය රු. 22,935-645x10-790x8-1050-17-53555 වේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව වැටුප් ගෙවනු ලැබේ. වැටුප් වර්ධක ගෙවීම ඉහත 02 ඡේදයේ සඳහන් කාර්යක්‍ෂමතා කඩඉම සමත්වීමට යටත් වනු ඇත.

04. *සුදුසුකම්*

සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පෙර සම්පූර්ණ කර තිබිය යුතුය.

(අ) ශ්‍රී ලාංකිකයකු විය යුතුය.
(ආ) ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 25ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.
(ඇ) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.
(ඈ) අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්

I පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම

සහ

යන්ත්‍ර සූත්‍ර නඩත්තු කිරීම පිළිබඳ රජය පිළිගත් කර්මාන්ත ශාලාවක/වැඩහලක අවු. 05ක පළපුරුද්දක් ලබා තිබීම.

05. *බඳවා ගැනීමේ ක්‍රමය*

මූලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයැදුම්කරුවන් සම්මුඛ පරීක්‍ෂණ මණ්ඩලයක් වෙත ඉදිරිපත් කිරීම මගින් තෝරා ගන්නා අතර, රාජ්‍ය සේවා කොමිෂම වෙනුවෙන් යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරනු ලැබේ.

06. පහත සඳහන් ලියකියවිලි සියල්ලේ ම තමා විසින් සත්‍ය බවට සහතික කරන ලද පිටපතක් අයැදුම් පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය.

(i) උප්පැන්න සහතිකය (සැ. යු. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ උපකෘත පාසලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ භෞතිස්ම සහතික භාරගනු නොලැබේ.)

(ii) හැදෑරූ විෂයන්වල විස්තර සහිතව උපාධි සහතික හෝ අනෙකුත් අධ්‍යාපන සහතික

(iii) පළපුරුද්ද සනාථ කෙරෙන වෘත්තීය සහ/හෝ තාක්‍ෂණික සුදුසුකම් දැක්වෙන සහතික

(iv) සිංහලෙන්, දෙමළෙන් සහ ඉංග්‍රීසියෙන් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

07. රාජ්‍ය සේවයේ නියුතු අපේක්‍ෂකයින්ගේ ඇයදුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු වේ.

08. මෙම ගැසට් පත්‍රයේ පළමු වන කොටසේ (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි කෙරෙහි අපේක්‍ෂකයින්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

09. පුරප්පාඩු නොපිරවීමේ අයිතිය යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් සතුවේ.

10. ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 10 සිට 12 තෙක් ඡේදයන්හි වගන්ති තනතුරට ගැලපෙන පරිදි අදාල වේ.

සු. සෝ. හේවාපතිරණ,
ලේකම්,
යෞවන කටයුතු හා නිපුණතා
සංවර්ධන අමාත්‍යාංශය.

2011 ජනවාරි මස 21 වැනි දින,
යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය,
නිපුණතා පියස,
354/2,
ඇල්විටිගල මාවත,
කොළඹ 05.

*ආදර්ශ අයදුම් පත්‍රය*

*යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය*

ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නඩත්තු ඉංජිනේරු තනතුර සඳහා බඳවා ගැනීමේ අයදුම් පත්‍රය

01. මුලකුරු අගට යොදා
මුලකුරු සමග නම : | | | | | | | | | | | | | | |
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

උදාහරණ ෑ SILVA, A. B.

02. සම්පූර්ණ නම :—————.

03.
(අ) රාජකාරි ලිපිනය :—————.
(ආ) පෞද්ගලික ලිපිනය ෑ (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.
(ඇ) පෞද්ගලික දුරකථන අංකය :—————.

04. (අ) ඔබ ශ්‍රී ලාංකිකයකු ද යන වග : ඔව් ☐ නැත ☐

05. (අ) උපන් දිනය :

වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

(ආ) ජාතික හැඳුනුම්පත් අංකය ☐☐☐☐☐☐☐☐☐☐

06. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

07. දැනට දරන තනතුර පිළිබඳ විස්තර :
(අ) තනතුර හා පත්වීමේ දිනය :—————.
(ආ) තනතුර ස්ථිර ද තාවකාලික ද යන වග :—————.
(ඇ) තනතුර විශ්‍රාම වැටුප් සහිත ද යන වග :—————.
(ඈ) තනතුරෙහි ස්ථිර කර ඇත්ද යන වග :—————.
(ඉ) දෙපාර්තමේන්තුව :—————.
(ඊ) ආයතනය/සේවා ස්ථානය :—————.

08. අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ විස්තර (සිංහල, දෙමළ භාෂාවෙහි ප්‍රවීනතාවය පිළිබඳ සහතික ද ඇතුළුව)

| *සමත් වූ විභාගය* | *විශ්ව විද්‍යාලය/ ආයතනය* | *සමත් වර්ෂය* | *විෂය ක්ෂේත්‍රය* |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |

09. කලින් දරන තනතුරු (වකවානු පිළිවෙලින් නිවැරදි දින සහිතව සඳහන් කරන්න)

| *දෙපාර්තමේන්තුව /ආයතනය* | *සේවා ස්ථානය* | *තනතුර* | *ස්ථිර ද තාවකාලික ද යන වග* | *සිට* | *තෙක්* | *සේවා කාලය* |
|---|---|---|---|---|---|---|
| 1. | | | | | | |
| 2. | | | | | | |
| 3. | | | | | | |
| 4. | | | | | | |

10. ඔබ අධිකරණයක් මගින් වරදකරු වී තිබේ ද? එසේ නම් විස්තර දක්වන්න. :—————.

11. මීට පෙර රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක හෝ මණ්ඩලයක සේවයේ නියුක්තව සිටියේ නම් සේවයෙන් ඉවත්වීමට/ඉවත් කිරීමට හේතුව දක්වන්න :—————.

12. ඔබට විරුද්ධව කිසියම් විනයානුකූලව පරීක්ෂණයක් පැවැත්වෙමින් තිබේ ද? එසේ නම් විස්තර කෙටියෙන් දක්වන්න. :—————.

ම' විසින් මෙම අයදුම්පත්‍රයෙහි සඳහන් කර ඇති විස්තර සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙහි සඳහන් විස්තර සාවද්‍ය බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් එයින් මා නුසුදුස්සකු වීමට ඉඩ ඇති බව ද තෝරා ගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත්, කිසිදු වන්දියක් නොලබා මා තනතුරින් පහ කිරීමට යටත් වන බව ද මම දනිමි.

—————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :—————.

දැනට රජයේ සහ පළාත් රාජ්‍ය සේවයේ සිටින අයදුම්කරුවන් සඳහා

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය.

ඉහත අයදුම්කරුගේ අනු අංක 01 සිට 12 තෙක් සඳහන් තොරතුරු නිවැරදි බව සහතික කරමි.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :—————.

01-373

## රාජ්‍ය භාෂා කොමිෂන් සභාව

රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ පහත සඳහන් තනතුරේ පවත්නා පුරප්පාඩුව පිරවීම සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති පරිදි සුදුසුකම් සපුරාලන මනා ශරීර සෞඛ්‍යයකින් හා විශිෂ්ඨ චරිතයකින් යුත් ශ්‍රී ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. භාෂා නිලධාරී (ත්‍රෛභාෂා) සහ පර්යේෂණ නිලධාරී

පහතින් දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස්කරන ලද අයදුම්පත්, "සභාපති, රාජ්‍ය භාෂා කොමිෂන් සභාව, 4 වන මහල, භාෂා මන්දිරය, 341/7, කොට්ටේ පාර, රාජගිරිය" යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ අයදුම්කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2011.02.18 දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට එවිය යුතුය. ඉන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

01. භාෂා නිලධාරී (ත්‍රෛභාෂා) සහ පර්යේෂණ නිලධාරී (තනතුරු 01)

(i) සුදුසුකම් හා පළපුරුද්ද :

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් ලබා තිබිය යුතුය.
(ආ) ත්‍රෛභාෂික භාෂා පරිවර්තනය කිරීමේ (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි) පළපුරුද්ද ලබා තිබිය යුතුය.
(ඇ) පරිගණක භාවිතය පිළිබඳ දැනුම ලබා තිබිය යුතුය.
(ඈ) පර්යේෂණ කටයුතු වල යෙදී සිටි අයෙකු විය යුතුය.

*සටහන*.-සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලට පොත් පරිවර්තනය කර ඇති අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ii) *වයස් සීමාව* :
2011.02.18 දිනට වයස අවුරුදු 30ට නොඅඩු හා අවු. 45ට නොවැඩි විය යුතුය. (මෙහි සඳහන් උපරිම වයස් සීමාව රාජ්‍ය සේවයෙහි හෝ පළාත් රාජ්‍ය සේවයෙහි නියුක්ත නිලධාරීන්ට හෝ රාජ්‍ය සංස්ථා හෝ මණ්ඩලවල නියුක්ත සේවකයින්ට අදාළ නොවේ.)

(iii) *වැටුප් පරිමාණය*
මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 24,725-5x550-5x645-15x770-42,250 කි. (තෝරා ගනු ලබන අපේක්ෂකයාගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව මෙම වැටුප් ක්‍රමයේ සුදුසු වැටුප් පියවරක තබනු ලැබේ.)

(iv) *බඳවා ගැනීමේ ක්‍රමය*
බඳවා ගැනීම සිදුකරන්නේ මූලික සුදුසුකම් ඇති අයදුම්කරුවන් මේ සඳහා පත් කරනු ලබන විශේෂ මණ්ඩලයක් මගින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙනි.

සේවා කොන්දේසි සහ ඉල්ලුම් කළයුතු ආකාරය

(අ) මෙම තනතුර ස්ථිරය. පත්වීම්ලාභියා සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. පත්වීම්ලාභියා විසින් ඒකාබද්ධ වැටුපෙන් 8%ක දායක මුදලක් ගෙවිය යුතු අතර කොමිෂන් සභාව විසින් 12%ක් ගෙවනු ඇත. මෙයට අමතරව 3% සේවා නියුක්තියන්ගේ භාර අරමුදලට කොමිෂන් සභාව විසින් ගෙවනු ඇත.

(ආ) පරිවාස කාලය අවු. 03කි. පත්වීම්ලාභියා සිය පරිවාස කාල සීමාව ඇතුළත රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන තමන්ට අදාළ භාෂාව පිළිබඳ උසස් පෙළ පාඨමාලාව සමත්විය යුතුය. (එනම්, සිංහල මාධ්‍ය නිලධාරියකු නම් දෙමළ භාෂා උසස් පාඨමාලාවද දෙමළ මාධ්‍ය නිලධාරියකු නම් සිංහල භාෂා උසස් පෙළ පාඨමාලාව ද සමත් විය යුතුය.)

(ඇ) දීර්ඝ කරනු ලබන පරිවාස කාල සීමාව තුළදීවත් ඉහත සඳහන් නියමිත මට්ටමේ ප්‍රවීණතාව ලබා ගැනීමට අසමත්වුවහොත් පත්වීම්ලාභියාගේ සේවය අවසන් කරනු ලැබේ.

(ඈ) රජයේ සේවයෙහි ද පළාත් බද රාජ්‍ය සේවයේ හි ද ව්‍යවස්ථාපිත මණ්ඩලවලට ද සංස්ථාවල ද සේවය කරන නිලධාරින්ගේ ඉල්ලුම් පත්‍ර අදාළ දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ප්‍රධානියා මගින් එවිය යුතුය.

(ඉ) සුදුසුකම් ඇති අපේක්ෂකයින් පමණක් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අතර තෝරා ගනු ලබන්නේ එම සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මතය.

(ඊ) මෙම නිවේදනයේ විධිවිධානවලට පරිබාහිර වූ කරුණු පිළිබඳ තීරණ රාජ්‍ය භාෂා කොමිෂන් සභාව විසින් ගනු ලබනු ඇත.

(උ) මෙම නියමයන්ට අනුකූල නොවන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ඌ) කලින් කලට රජය විසින් නියම කරනු ලබන ප්‍රවීනත්වය සහ නිපුණත්වය පත්වීම්ලාභියා විසින් ලබාගත යුතුය.

————————,
සභාපති.

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව,
4 වන මහල,
භාෂා මන්දිරය,
341/7, කෝට්ටේ පාර,
රාජගිරිය.

### රාජ්‍ය භාෂා කොමිෂන් සභාව

..................**තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය**

01. ඉල්ලුම්කරුගේ නම :
1.01 මුලකුරු සහිත නම :—————.
1.02 සම්පූර්ණ නම :—————.

02. ලිපිනය :
2.01 ස්ථිර ලිපිනය :—————.
2.02 කාර්යාලීය ලිපිනය (තිබේ නම්) :—————.

03. ස්ත්‍රී/පුරුෂ භාවය :
පිරිමි 1
ගැහැණු 2 (අදාළ අංකය කොටුවේ සටහන් කරන්න.)

04. වයස (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)
4.01 උපන් දිනය :—————.

4.02 2011.02.18 දිනට වයස :

අවු. :—————. මාස :—————. දින :—————.

05. විවාහක/අවිවාහක බව :————.

06. ජාතිය :————.

07. සුදුසුකම් (සහතික වල ඡායා පිටපත් ඇමිණිය යුතුය)

(i) අ. පො. ස. (සා. පෙළ.) වර්ෂය :————.

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

(ii) අ. පො. ස. (උ. පෙළ.) වර්ෂය :————.

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

(iii) උපාධිය :

| උපාධිය සහ විශ්ව විද්‍යාලයේ නම | වර්ෂය | පන්තිය | විෂයය |
|---|---|---|---|
| | | | |

(iv) ඩිප්ලෝමා :

| ඩිප්ලෝමාවේ සහ එය පිරිනැමූ ආයතනයේ නම | වර්ෂය | පන්තිය | විෂයය |
|---|---|---|---|
| | | | |

(v) හදාරා ඇති වෙනත් පාඨමාලා :

| පාඨමාලාවේ නම | පාඨමාලාව පැවැත් වූ ආයතනයේ නම | පාඨමාලා කාලසීමාව |
|---|---|---|
| | | |

08. පළපුරුද්ද :

| තනතුර | ආයතනය | සේවා කාලය | හැරයාමට හේතුව |
|---|---|---|---|
| | | | |

09. පරිගණක භාවිතය පිළිබඳ දැනුම (සහතික වල පිටපත් ඇමිණිය යුතුය)

10. ඔබ කවර වරදකට හෝ අධිකරණයේ දී වරදකරු වී තිබේ ද? ඔව්/නැත (ඔව් නම් විස්තර සඳහන් කරන්න)

මගේ දැනීමේ හැටියට මෙම ඉල්ලුම් පත්‍රයෙහි ම විසින් සඳහන් කර ඇති විස්තර සත්‍ය සහ නිවැරදි ඒවා බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් කිසියම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව, මා පත් කරනු ලැබීමට පෙර හෙළිදරව් වුවහොත් මා නුසුදුස්සෙකු කරනු ලැබීමට යටත් වන බවත් එම වරදපත් කරනු ලැබීමෙන් පසු එළිදරව් වුවහොත් මා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවත් මම දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

**රජයේ දෙපාර්තමේන්තු/අමාත්‍යාංශ/අධිකාරිවල ප්‍රධානියාගේ සහතිකය**

.................................... වශයෙන් මෙම දෙපාර්තමේන්තුවේ/ අමාත්‍යාංශයේ/ සංස්ථාවේ/අධිකාරියේ/පළාත් සභාවේ සේවය කරන ....................... මහතාගේ/මහත්මියගේ/මෙනෙවියගේ ඉල්ලුම් පත්‍රය මේ සමඟ ඉදිරිපත් කරමි. ඔහුගේ/ඇයගේ සේවය සහ හැසිරීම සතුටුදායකය/අසතුටුදායකය ඇය මෙම තනතුරට තෝරාගනු ලැබුවහොත් නිදහස්කිරීම සලකා බලමි.

————,
දෙපාර්තමේන්තුවේ/අමාත්‍යාංශයේ/සංස්ථාවේ/
පළාත් ප්‍රධානියාගේ අත්සන.

නම :————.

තනතුර :————.

ලිපිනය :————.

දිනය :————.

01-421